මුහුදු පත්ලේ ගිලුණු රුසියානු කර්ස්ක් න්‍යෂ්ටික සබ්මැරීනය ගොඩගැනීම

පසුගිය වසරේ බරන්ට්ස් මුහුදේ යාත්‍රා කරමින් සිටියදී අනතුරට පත් කර්ස්ක් නම් රුසියානු න්‍යෂ්ටික සබ්මැරීනය ගොඩගැනීම සඳහා විශේෂ මෙහෙයුමක් දියත් කර තිබේ. මේ මෙහෙයුම් ව්‍යාපෘතිය සඳහා නැව් හා යාත්‍රා අටක් ද 150 දෙනෙකුගෙන් සමන්විත නාවික පිරිසක් ද යොදාගෙන ඇති අතර රුසියානු හා ඕලන්ද විශේෂඥයන් පිරිසකගේ උපදෙස් මේ කටයුත්ත සඳහා ලැබෙනු ඇත.
මීට 13 මසකට පෙර පිපිරීම් දෙකක් සිදුවීම නිසා අනතුරට පත් මේ සබ්මැරීනය තුළ සිටි 118 ක් මිය ගියහ. ඔවුන් ගලවාගත නොහැකි වූවේ දැඩි කුණාටු සහිත කාලගුණය නිසා ය. නව මෙහෙයුම සැප්තැම්බර් මස තුළදී අවසන් කිරීමට ඔවුහු බලාපොරොත්තු වෙති.

ඉදිරිපස කොටස වෙන් කිරීම

සබ්මැරීනයේ ඉදිරිපස කොටස එසවීමට පෙර කපා වෙන් කෙරේ.



ඔසවන වේදිකාව

මුහුදු රළ පාලන පද්ධති

මීටර දෙකකට වඩා ඉහළ නගින මුහුදු රැළිවල බලය අවම කිරීමට ක්‍රියාකරන පද්ධතියක් සකසා ඇත.

එසවීමට යොදා ගන්නා එක් කේබල කට්ටලයකට තනි වානේ කේබල 54 ක් ඇති අතර එම කේබල පොකුර සෙ.මී. 180 ක විෂ්කම්භයකින් යුක්තය. පරිගණකයෙන් පාලනය කෙරෙන මේ ඔසවන වේදිකා 26 න් එකක් මගින් වරකට සෙ.මී. 40 කේබල පොකුරක් බැගින් එසැවේ. මේ කේබල සවිකර ඇත්තේ විශේෂ ධාරකයකට ය.



ඔසොවන ක්‍රියාවලිය



- කර්ස්ක් යානයේ බඳේ සෙ.මී. 70 ක් පළල සිදුරු 26 ක් කපනු ලැබේ.
- ස්වයං පාලිත යෝධ දම්වැල් කියතක් මගින් ඉදිරිපස කොටස කැපේ
- කේබල යා කෙරෙන කෙවෙනි සම්බන්ධ කෙරෙන්නේ කිමිදුම්කරුවන් අතිනි
- පාවෙන යෝධ පාරුවක් මගින් 26 පළකින් කර්ස්ක් යානය එසැවීමට පිළියෙළ කොට ඇත. මුළින් එසවෙන්නේ පසුපසයි. ඊට යෙදෙන කේබලවල ආතතිය පාලනය කෙරෙන්නේ පරිගණකයෙනි.
- කර්ස්ක් යානය යෝධ බත්තලට බැන්ද පසු ටග් යාත්‍රා මගින් මර්මැන්ස්ක් අසල පිහිටි වියළි තටාකාංගනයකට ගෙන යනු ලැබේ.

කර්ස්ක් යානයට ඉහළින් ඇති ධාරකය (පොන්ටූනය) මුහුදු පත්ලට සවිකර ඇත්තේ විශේෂ කේබල අටකිනි. ධාරකය සෙලවීම වැළැක්වීම. මේ කේබලවලින් සිදුවේ.

කෙවෙනි



කර්ස්ක් යානයේ පැතිකඩක්



බර ටොන් 18000